පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරය - 2019

---

**1.1** මතය වියාචනය

පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2** මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, භාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය භාරය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා භාරයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

භාරයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, භාරයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස භාරයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් භාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ භාරයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ භාරයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, භාරය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිත අංක 02 අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | ප්‍රමිත ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | ප්‍රමිත අංක 3 හි 16 ඡේදයට අනුව සමාන ගණුදෙනු සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රමය සංගත විය යුතුයි. එසේ වුවද ඉකුත් වර්ෂයේ දළ ආයෝජන පොළිය ගිණුම්ගත කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු.22,450,979 ක් වූ ශුද්ධ ආයෝජන පොලී ආදායම ගිණුම්ගත කර තිබුණු හෙයින් රු.1,181,630 ක රඳවා ගැනීමේ බදු වියදම (With Holding Tax) ගිණුම්වලින් අත්හැරී තිබුණි. | පිළිතුරු ලැබී නැත. | ප්‍රමිත ප්‍රකාරව සමාන ගණුදෙනු සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතවන ආකාරයට ගිණුම් තැබීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රමිත අංක 07 හි 57 ඡේදයට පටහැනිව මුළු පිරිවැය රු.**38,598,438** ක් වූ පිරිපහදු යන්ත්‍රාගාරයේ යන්ත්‍ර හා ගොඩනැගිලි, වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමකින් තොරව සියයට 5 බැගින් ක්ෂය කර තිබුණි. | පිළිතුරු ලැබී නැත. | ප්‍රමිතය ප්‍රකාරව ගොඩනැගිලි හා යන්ත්‍ර වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ක්ෂය ප්‍රතිපාදනය සිදුකළ යුතුය. |
| (ඈ) | ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණු පිරිවැය රු.**2,147,120** ක් වූ ස්ථාවර වත්කම් 2 ක් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණ ද එම වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු ප්‍රයෝජනයට ගන්නා ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.3** ගිණුම්කරණ අඩුපාඩු
---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2018** වර්ෂයේදී සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබු ගත්මිල රු. **365,000** ක් වූ ත්‍රීරෝද රථය රු. **205,000** කට අලෙවි කළ විකිණීමෙන් ලැබුණු මුදල ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබුණු මුදලක් ලෙස ගිණුම්ගත කිරීම හැර ස්ථාවර වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙවැනි අඩුපාඩු ඉදිරියේදී ඇති නොවීමට අදාල නිලධාරින්ට උපදෙස් ලබා දී ඇති බව දන්වා ඇත. | ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | **2018** දෙසැම්බර් **07** දින ආයෝජනය කළ රු. **6,000,000** ක ස්ථාවර තැන්පතුව සඳහා ඉකුත් වර්ෂයේ ලැබූ පොලී ආදායම රු. **48,798** ක් ඉකුත් වර්ෂයට ගැලපීම් නොකර සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු පොලී ආදායම රු. **50,000** ක් ගිණුම්ගත කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික පොලී ආදායමින් රැඳවුම් බද්ද අඩුකර ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොළී ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | මහජන ඇමතුම් පද්ධතිය වෙනුවෙන් ඇම්ප්ලිෆයර් උපකරණයක් **(Amplifier)** මිලදී ගැනීම සඳහා වැය කරන ලද රු.**559,498** ක මුදල ප්‍රාග්ධනිත කරනු වෙනුවට අයභාර වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | **2020** ගිණුම් පිළියෙල කිරීමේදී ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | ස්ථාවර වත්කම් මිලදී ගැනීම් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගිණුම්කරණ පද්ධතියක් (Accounting System) මිලදී ගැනීම් වටිනාකම වූ රු.45,000ක් ප්‍රාග්ධන වියදමක් හා අයභාර වියදමක් ලෙස දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | 2020 ගිණුම් පිළියෙල කිරීමේදී ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇති බව දන්වා ඇත. | ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2016,2017,2018 හා 2019 වර්ෂ සඳහා විගණන ගාස්තු සඳහා වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | ඇස්තමේන්තු කළ හැකි වියදම් සඳහා වෙන්කිරීම් සිදුකළ යුතුය. |

**1.5.4** නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ලෙජර් ගිණුම 6 | 409,466,461 | 336,453,900 | 73,012,561 | පිළිතුරු ලැබී නැත. | නිවැරදිව ලෙජර් ගිණුම් පිළියෙල කර ඒ අනුව ශේෂ පිරික්සුමක් සකස් කළ යුතුය. |
| ලෙජර් ගිණුම 8 | 1,381,295,739 | 1,383,861 | 85,912,474 | පිළිතුරු ලැබී නැත. | නිවැරදිව ලෙජර් ගිණුම් පිළියෙල කර ඒ අනුව ශේෂ පිරික්සුමක් සකස් කළ යුතුය. |
| ලෙජර් ගිණුම 06 | 0 | 176,618,286 | 176,618,286 | පිළිතුරු ලැබී නැත. | නිවැරදිව ලෙජර් ගිණුම් පිළියෙල කර ඒ අනුව ශේෂ පිරික්සුමක් සකස් කළ යුතුය. |
| ලෙජර් ගිණුම 03 | 0 | 2,268,198 | 2,268,198 | පිළිතුරු ලැබී නැත. | නිවැරදිව ලෙජර් ගිණුම් පිළියෙල කර ඒ අනුව ශේෂ පිරික්සුමක් සකස් කළ යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | ආරක්ෂක සේවා වියදම් | **2,676,110** | ගෙවීම් වවුචර **04** | පිළිතුරු ලැබී නැත. | මුදල් රෙගුලාසි **272(3)** ප්‍රකාරව සියලුම ගෙවීම් වවුචර විගණකාධිපති වෙත ඉදරිපත් කළ යුතුය. |
| (ආ) | සුළු මුදල් ගෙවීම් | **696,466** | බිල්පත් | පිළිතුරු ලැබී නැත. | සුළු මුදලින් කළ ගෙවීම්වලට අදාල බිල්පත් වවුචරය සමඟ ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ගොඩනැගිලි | **1,235,359,985** | ගොඩනැගිලි හඳුනාගැනීමට අදාල තොරතුරු | පිළිතුරු ලැබී නැත. | ස්ථාවර වත්කම් වෙන වෙනම හඳුනාගත හැකිවන පරිදි තොරතුරු පවත්වාගෙන යා යුතුය. |
| (ඈ) | තාවකාලිකව නවතන ලද ආපසු ගෙවන තැන්පතු ශේෂය | **5,550,000** | ශේෂ සනාථ | පිළිතුරු ලැබී නැත. | ශේෂ සනාථ කෙරෙන ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | මුදල් හා මුදල් සමාන දෑ | **8,982,954** | බැංකු සැසඳුම් ප්‍රකාශ | පිළිතුරු ලැබී නැත. | මුදල් පොතක් පිළියෙල කළ යුතු අතර මුදල් හා මුදල් සමාන දෑ ශේෂය හා බැංකු ශේෂය සැසඳීම සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතුය. |
| (ඊ) | මූල්‍ය ප්‍රකාශන ගැලපීම් | **1,629,047** | විධිමත්ව පිළියෙල කළ ජ'නල් සටහන් | පිළිතුරු ලැබී නැත. | විධිමත්ව ජ'නල් සටහන් පිළියෙල කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීතිරීති, රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහයේ ii වැනි පරිච්ඡේදයේ 13.7 වගන්තිය හා 2016 ජුනි 20 දිනැති අංක DMS/1831 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් භාරය සඳහා කාර්ය මණ්ඩලය අනුමත කර වර්ෂ 4 කට වැඩි කාලයක් ඉක්මගොස් තිබුණ ද භාරයේ ගණකාධිකාරි තනතුරෙහි පුරප්පාඩුව සඳහා බඳවා ගැනීම් සිදුකර නොතිබූ අතර භාර මණ්ඩලයේ තීරණයක් මත 2016 වර්ෂයේ සිට අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරි කළමනාකරණ භාරයේ ගණකාධිකාරි තනතුරෙහි රාජකාරි ආවරණය කිරීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා රු.303,000 ක් ගෙවා තිබුණි. ආයතන සංග්‍රහයේ ii වැනි පරිච්ඡේදයේ 13.7 වගන්තිය ප්‍රකාර පුරප්පාඩු වූ තනතුරක රාජකාර කටයුතු ආවරණය කිරීම සඳහා යොදා ඇති වැඩපිළිවෙලක් යටතේ එම රාජකාරි කටයුතු ආවරණය කරන නිලධාරියාට අතිරේක පාරිශ්‍රමයක් ගෙවීමට හිමිකම් නොමැති බව දැක්වේ. එහෙත් ඊට පටහැනිව කටයුතු කර තිබුණු අතර පුරප්පාඩුව නොපිරවීම හේතුවෙන් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නියමිත දිනවල දී විගණනය සඳහා ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබුණි. | ධීවර අමාත්‍යාංශයෙන් නිලධාරියකු පත්කිරීමෙන් අදාල සේවාවන් ඉටුකර ගැනීමට කළමණාකරන භාරයට හැකිවී ඇති බව දන්වා ඇත. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි භාරය විධිමත් ආකාරයෙන් පවත්වා ගෙන යාමට අවශ්‍ය පුරප්පාඩු වූ තනතුරුවලට නිලධාරීන් බඳවා ගැනීම කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 264 | සෑම ගෙවීම් වවුචරයක්ම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබාගත් කුවිතාන්සියෙන් තහවුරු විය යුතු වුවත් රු.1,918,763 ක ගෙවීම් සම්බන්ධයෙන් එසේ කුවිතාන්සි ලබාගත් බව සනාථ නොවීය. | මෙම ගෙවීම් සම්බන්ධව ආදායකයන්ගෙන් කුවිතාන්සි ලබා නොගන්නා අතර අදාල මුදල ලබාගත් බවට අත්සන් ලේඛනයක් පරිපාලන කාර්යාලය පවත්වාගෙන යන බව දන්වා ඇත. | දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබාගත් තහවුරුවක් වවුචරයේ දැක්වීම කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | ස්ථාවර වත්කම් වෙන වෙනම හඳුනාගත හැකිවන පරිදි ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. |
| (ඈ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3(ආ) ඡේදය | ව්‍යාවස්ථාපිත නොවන කිසියම් අරමුදලක් තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මඟින් නිතීගත කිරීමට හැකිවන පරිදි අදාල හේතු දක්වමින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර ව්‍යාවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව තවදුරටත් අධ්‍යයනය කර කළමණාකරන භාරය දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි කටයුතු කර ව්‍යාවස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2013 අංක 17 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 10 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 99 ක බදුකුලී ආදායමක් භාරය උපයාගෙන තිබුණ ද එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා ලියාපදිංචි වීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව කළමණාකරන භාරය දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා ලියාපදිංචි වීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2010 අගෝස්තු 10 දිනැති භාර ඔප්පුව | | | |
| | (i) අංක 6(අ) 1 ඡේදය | භාරයේ සියලුම අතිරික්ත මුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආණ්ඩුවේ සුරැකුම්පත්වල හැර වෙනත් යම් ආකාරයකින් ආයෝජනය කිරීමට භාණ්ඩාගාරයේ පූර්ව ලිඛිත එකඟතාවය ලබාගත යුතු වුවත් එවැනි එකඟතාවයක් නොමැතිව භාරකාර මණ්ඩලයේ තීරණයන් මත පමණක් 2019 වර්ෂය තුලදී ද රාජ්‍ය බැංකු දෙකක රු.මිලියන 245 කට වැඩි මුදලක් ආයෝජනය කර තිබුණි. | මෙම ස්ථාවර තැන්පතු ආරම්භ කර ඇත්තේ භාර ඔප්පුවේ අංක 7(එ) හා අංක 9(ආ) වගන්ති ප්‍රකාරව බව දන්වා ඇත. | භාරය පිහිටුවීමේ ඇති කරගත් ගිවිසුමේ 6(අ)1 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (i) අංක 6 (අ) II ඡේදය | භාරකරුවන්ගේ සාමාන්‍ය බලතල යටතේ මෙහෙයුම්/ නඩත්තු වියදම්වලට අදාල වියදම් හැර සෙසු වියදම් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිඛිත අනුමැතිය ඇතිව පමණක් කළ යුතු වුවත් භාරයේ එවකට සිටි සහකාර කළමනාකරු වෙත 2016 | කළමනාකරණ භාරයේ අනුමැතිය ලබාගෙන මෙම ගෙවීම් සිදු කර ඇති බව දන්වා ඇත. | භාරය පිහිටුවීමේ ඇති කරගත් ගිවිසුමේ 6(අ) II ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ඔක්තෝබර් සිට **2018** ජුනි දක්වා මාස **20** ක් හා දින **24** ක් සඳහා හිඟ ප්‍රවාහන දීමනාවක් වශයෙන් රු.**282,529** ක් ද ඇතුලුව රු.**519,354** ක් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබානොගෙන ගෙවීම් කර තිබුණි. | | |
| **(iii)** | අංක **8**(ඊ) ඡේදය | වැටුප්, දීමනා හෝ සම්මාන මුදලක් වශයෙන් යම් පාරිශ්‍රමිකයක් ලබාගැනීමට භාරකරුවන්ට හිමිකමක් නොමැති බව සඳහන් වුවත් ඒ පිළිබඳව නොසලකා භාරකාර මණ්ඩලය සඳහා පළමුවැන්නා ලෙස නම් කළ, භාරකාර මණ්ඩලයේ සභාපති වරයාද වන ධීවර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත **2019** ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු.**27,000** ත් රු.**35,000** ත් අතර එකතුව රු.**323,000** ක මුදලක් මාසික දීමනා ලෙස ගෙවා තිබුණි. | මෙම ගෙවීම් සිදු කර ඇත්තේ සභාපති වශයෙන් ඉටු කරන කාර්යයට නොවන බවත් ධීවර අමාත්‍යාංශයේ ලේකම් ධූරය දරමින් අධීක්ෂණ රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් කළමණාකරන භාරයේ අනුමැතිය මත ගෙවීම් සිදු කර ඇති බවත් දන්වා ඇත. | භාරය පිහිටුවීමේ ඇති කරගත් ගිවිසුමේ **8**(ඊ) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඌ) | **2010** ජුනි **03** දිනැති අංක අමප/**10/0958/438/001** දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අදාල මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාවරයාගේ නිරීක්ෂණ (ආ)**(ii)** | වෙළඳ සංකීර්ණයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා ලංකා ධීවර සංස්ථාවේ සහ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලවලින් හඳුනාගත් නිලධාරීන් පමණක් කළමනාකරණ භාරයට අනුයුක්ත කරගත යුතු බව දක්වා තිබුණද භාරයේ කළමනාකරු (මෙහෙයුම්) තනතුර සඳහා ධීවර අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන් දෙදෙනෙකු මඟින් රාජකාරි ඉටුකර ගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් **2019** වර්ෂය තුල කාලපරිච්ඡේද දෙකක් සඳහා රු.**266,903** ක් ගෙවා තිබුණි. | වැඩ බැලීමේ දීමනා මත පත්කර ඇති අතර ඒමඟින් පලපුරුද්ද හා කාර්යක්ෂම සේවාවක් ඉටු කර ගැනීමට හැකිව පවතින අතර අඩු පිරිවැයකින් ඉටු කර ගැනීමට හැකි වී ඇති බව දන්වා ඇත. | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාවරයා ගේ නිරීක්ෂණ මත අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි තනතුරුවලට නිලධාරීන් බඳවා ගැනීම කළ යුතුය. |

**2.** මූල්‍ය සමාලෝචනය
---------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵල
--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.**1,603,164** ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ පාඩුව රු.**21,507,832** ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.**23,110,996** ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සේවක වැටුප් හා දීමනා, විදුලි පාරිභෝජනය හා නඩත්තු වියදම් අඩුවීමත් වෙළඳ කුටි පැවරුම්, බදු කුලී ආදායම් හා ජල ගාස්තු යන ආදායම් වැඩිවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| ආදායම් ප්‍රවණතා | 2019 | 2018 | ප්‍රතිශතය | නිරීක්ෂණය |
|---|---|---|---|---|
| වෙළඳ කුටි පැවරුම් | 4,500,000 | 3,000,000 | 50% | සමාලෝචිත වර්ෂය තුළ වෙළඳ කුටි පැවරුම් සංඛ්‍යාව වැඩිවීම. |
| බදු කුලී ආදායම් | 99,946,000 | 93,478,900 | 7% | සාමාන්‍ය වැඩිවීමක් පැවතීම. |
| වාහන ගාල් කිරීමේ ආදායම | 4,085,961 | 2,772,482 | 47% | වාහන පරිශ්‍රය තුළ ගාල් කරගෙන සිටින කාල ප්‍රමාණයට ගාස්තු අය කිරීමේ ක්‍රමවේදයක් තීරණය කර තිබීමත් ඒ අනුව පරිගණක මෘදුකාංගය වෙනස් කිරීමට කටයුතු කර තිබීම. |
| ජල ගාස්තු | 1,417,449 | 595,031 | 138% | කැට අයිස් නිෂ්පාදනය වැඩිවීමත් සමඟම ජලය සැපයීම වැඩිවීම. |
| **වියදම් ප්‍රවණතා** | | | | |
| සේවක වැටුප් හා දීමනා | 18,791,481 | 22,017,107 | 15% | භාරයේ රාජකාරි සිදුකළ ලංකා ධීවර සංස්ථාවේ සේවකයින් අඩුකර තිබීම. |
| විදුලි පරිභෝජනය | 5,142,256 | 7,331,001 | 29% | ඉකුත් වර්ෂයට වඩා විදුලි පාරිභෝජනය අඩුවීම. |
| නඩත්තු වියදම් | 3,762,635 | 9,795,542 | 61% | ඉකුත් වර්ෂයට වඩා නඩත්තු වියදම් අඩුවීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 මැයි 26 දින ස්ථාපිත භාරයේ රථවාහන අංගනයේ පරිපාලනය සඳහා ලංකා ධීවර සංස්ථාව විසින් පෞද්ගලික සමාගමක් සමඟ වර්ෂ 10 ක් සඳහා 2011 වර්ෂයේ දී එළඹි ගිවිසුම අනුව මාසික ශුද්ධ ලාභයෙන් සියයට 40 ක් ලංකා ධීවර සංස්ථාවට ද ඉතිරි සියයට 60 සමාගම සඳහා ලබාගැනීම භාර මණ්ඩලයෙන් අනුමැතිය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමක් කර නොතිබුණු අතර, 2019 දෙසැම්බර් 31 දින වන විටත් වර්තමානයට ගැලපෙන පරිදි ගිවිසුම සංශෝධනය කර නොතිබුණි. | ලංකා ධීවර සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය හිමි වී ඇති බැවින් භාර මණ්ඩලයෙන් අනුමැතිය ලබාගෙන නොමැති බවත් පවතින බදු ගිවිසුමෙහි කාලය ඉදිරි දිනකදී අවසන් වීමට නියමිත බැවින් නව බදු ගිවිසුම කළමාකරණ භාරයේ උපදෙස් මත සකස් කිරීමට උපදෙස් ලබා දී ඇත. | භාරය සතු වත්කම්වලින් භාරයට ආදායම් ලබාගැනීමට හැකිවන පරිදි ගිවිසුම සංශෝධනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වෙළඳ සංකීර්ණය පිහිටුවා ඇති හෙක්ටයාර් **3.1776** ක විශාලත්වයෙන් යුත් ඉඩම සමාලෝචිත වර්ෂය තුළදී ද භාරයට පවරාගැනීම සිදුකර නොතිබුණු අතර, එසේ පවරානොගෙන එම භූමියේ සිදුකර තිබුණු ඉදිකිරීම්වල වටිනාකම රු**1,688,741,540** ක් විය. | අදාල පැවරීම් කටයුතු අවසන් වී නැත. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව වෙළඳ සංකීර්ණය පිහිටි ඉඩම භාරයට පවරා ගත යුතුය. |
| (ඇ) | මධ්‍යම වෙළඳ සංකීර්ණයේ ස්ථාපිත විදුලිජනක යන්ත්‍රයට අවශ්‍ය බැටරි **4** ක් සමාලෝචිත වර්ෂයේ දී නැතිවීම සම්බන්ධයෙන් වූ පරීක්ෂණ වාර්තාව අනුව වූ රු.**20,000** ක අලාභයෙන් රු.**5,000** ක් පමණක් අයකරගෙන තිබුණි. | **2020** කොවිඩ් තත්ත්වය හේතුවෙන් මෙම මුදල් අය කර ගැනීමට නොහැකි වී ඇති අතර මේ වන විට මුදල් අයකිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | පරීක්ෂණ වාර්තාව අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | මධ්‍යම වෙළඳ සංකීර්ණය තුල සීසීටීවී කැමරා **29** ක් ක්‍රියාත්මක වුවද ඒවා මඟින් සිදුවන අකටයුතු කම් අනාවරණය කර ගැනීමේ හැකියාවක් නොමැති බව විගණනය විසින් ඉල්ලා සිටින තොරතුරු **2020** දෙසැම්බර් **31** දින වන විටත් නොලැබීම හේතුවෙන් තහවුරු විය. | සීසීටීවී කැමරා **29** වෙළඳසැල් ගොඩනැඟිල්ලේ අභ්‍යන්තරයට හා ඒ අවට ප්‍රදේශ ආවරණය වන පරිදි ස්ථානගත කර ඇති බවත්, යෝජිත සීසීටීවී කැමරා පද්ධතියෙන් අවට සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි සැලසුම් කිරීමට අදාල නිලධාරින්ට උපදෙස් ලබා දී ඇති බවත් දන්වා ඇත. | අවට සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි සුදුසු සීසීටීවී කැමරා පද්ධති සවි කර නඩත්තු කළ යුතුය. |

**3.2** **නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2019** වර්ෂය තුලදී රු.**45,000** කට මිලදී ගත් ගිණුම්කරණ පද්ධතියක් **(Accounting System)** ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර සියයට **20** බැගින් ක්ෂය කර තිබුණ ද එය පාවිච්චියට නොගෙන නිශ්ක්‍රියව තිබුණි. | යාවත්කාලීන කර පවත්වාගෙන යාමේදී ගැටලුකාරි තත්ත්වයක් මතු වී ඇති බවත් කොවිඩ් නිසා බිල් ගෙවීමට නොහැකි වීම නිසා සමාගම විසින් ගිණුම් පද්ධතිය අක්‍රිය කර ඇති බවත් දන්වා ඇත. | නිසි ප්‍රමිතයෙන් යුතු මිලදී ගැනීම් සිදු කළ යුතුය. |
| (ආ) | වෙළඳසැල් **154** කින් යුත් තොග වෙළඳ සංකීර්ණයට අමතරව වෙළඳසැල් **128** කින් යුත් සිල්ලර වෙළඳ සංකීර්ණයක් ද ඉදිකර තිබුණි. එයින් වෙළඳසැල් **64** ක් රු.**9,625,540** ක් වැයකර තොග වෙළඳසැල් බවට පරිවර්තනය කර තිබුණ ද **2019** දෙසැම්බර් **31** දින වන විට කිසිදු වෙළඳ සැලක් අලෙවි කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි. | සිල්ලර අංශයේ තොග හා සිල්ලර වෙළඳ කුටි බහුතරයක් බදු දී ඇති අතර, මාසික බදු මුදල දිගින් දිගට නොගෙවන විට වෙළඳ කුටි තැන්පත් මුදල භාරයට පවරාගෙන වෙනත් පාර්ශවයන්ට නැවත බදු දෙනු ලබන බව දන්වා ඇත. | වෙළඳ සැල් අලෙවි කටයුතු සඳහා යොදාගෙන සිල්ලර මත්ස්‍ය වෙළඳාම වැඩි දියුණු කිරීමට උපක්‍රම යෙදිය යුතුය. |

**3.3** ප්‍රසම්පාදන කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශීතාගාර 3 ක් හා පතුරු අයිස් යන්ත්‍රාගාරය අලුත්වැඩියා කර පවත්වාගෙන යාම හා නව කැට අයිස් යන්ත්‍රාගාරයක් ඉදිකර පවත්වාගෙන යාම සඳහා වූ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ දී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3, 2.4, 2.5, 2.6, 4.2.1(අ), 4.2.2(අ), 4.3 හා 5.4.8 (අ) යන මාර්ගෝපදේශයන් අනුගමනය කර නොතිබුණි. | ශීතාගාර හා පතුරු අයිස් යන්ත්‍රාගාරය අලුත්වැඩියා කර පවත්වාගෙන යාම මුල් කරගෙන ලංසු කැඳවීම සිදු කර ඇති අතර නව කැට අයිස් යන්ත්‍රාගාරය ඉදිකිරීම සඳහා ලබාදීමට එකඟ වූ ඉඩම නිරවුල් නොවීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව පවත්වාගෙන යාමට අපොහොසත් වී තිබෙන බව දන්වා ඇත. | භාරය වෙත ආර්ථික වාසි ලබා ගැනීම සඳහා 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන් අනුගමනය කළ යුතුය. |
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව 2019 ජනවාරි 31 දින ගිවිසුමකට එළඹිය යුතු වුවද, 2019 නොවැම්බර් 19 දින ගිවිසුමකට එළඹී තිබුණු අතර, ලංසු ලියවිලිවලට අනුව ගිවිසුමට එළඹීමෙන් පසු සතියක් තුල මාස 3 ක බදු මුදල වූ රු. 900,000 ක මූලික තැන්පතුවක් එකවර මුදලින් ලබාගෙන නොතිබුණි. තවද 2019 පෙබරවාරි සිට 2019 දෙසැම්බර් දක්වා මාස 11 ක කාලය තුල ලැබිය යුතු රු.5,980,000 ක් වූ මුදලින් 2019 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති මුදල රු.5,430,000 ක් හා ලංසු ලියවිල්ලේ කොන්දේසි ප්‍රකාරව කුලී ගෙවීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබූ අතර, බදු ගිවිසුම අවලංගු කිරීම සම්බන්ධයෙන් ද සලකා බලා නොතිබුණි. | විවිධ හේතූන් මත තමන් විසින් එකඟ වූ කොන්ත්‍රාත් මුදල භාරය වෙත ගෙවීමට අපහසු බව ලංසුකරු දන්වා ඇති බවත් ලංසුකරුගෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නොහැකිවී ඇති බවත් දන්වා ඇත. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර හිඟ කුලී සඳහා ප්‍රමාද ගාස්තු අයකිරීමට හෝ බදු ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා ආරක්ෂක සේවා වියදම රු.මිලියන 8 කට වැඩි වූ අතර එම සේවාව ලබාගැනීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර 2019 අගෝස්තු මස කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. තව ද ගිවිසුම ප්‍රකාරව ආරක්ෂක නිලධාරීන්ගේ පැමිණීමේ සටහන් සමඟ බිල්පත් සැසඳීමකින් තොරව 2019 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා මාස 5 ක කාලපරිච්ඡේදයක් සඳහා රු.3,737,700 ක් ගෙවා තිබුණි. | ධීවර සංස්ථාව ආරක්ෂක සේවාවෙන් ඉවත්වීමත් සමඟම මහජනයා ගැවසෙන ස්ථානවලට දැඩි ආරක්ෂාව ලබා දීමට සිදු වීම නිසා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා ප්‍රමාණවත් කාලයක් නොමැති වීම බව දන්වා ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර කොන්ත්‍රාත්තු ප්‍රදානය කළ යුතු අතර ගිවිසුම ප්‍රකාරව ගෙවීම් කළ යුතුය. |

**3.4** කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බදු ගැණුම්කරුවන් විසින් බදු ගිවිසුම උල්ලංඝණය කරමින් භාරයට වෙළඳසැල් භාර නොදී වෙනත් පාර්ශවයන්ට ලබා දී තිබීම සම්බන්ධයෙන් භාරය විධිමත් ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(අ), (ආ) හා (ඇ) යන මාර්ගෝපදේශයන්හි බැහැරවීම් නිරීක්ෂණය විය. | භාරයේ වෙළඳසැල් වෙනත් පාර්ශවයන් වෙත පැවරීම සම්පූර්ණයෙන් වැලැක්වීමට භාරය විසින් තීරණයකට එළඹ ඇත. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු හිඟ බදු ආදායම් ශේෂය රු.70,111,503 ක් වූ අතර එම ශේෂය තුල වසර 6 කට වැඩි කාලයක් පුරා පවතින හිඟ බදු ශේෂය රු.48,412,711 ක් විය. | මාසික බදු කුලිය ඊලඟ මාසය අවසානයට පෙර ගෙවිය හැකිවන ලෙස සංශෝධනය කර ඇති බවත් කුලී පැහැර හරින අවස්ථාවලදී සිහිකැඳවීම් ලිපි යැවීමට කටයුතු කර හිඟ මුදල හා දඩ අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වා ඇත. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5** මානව සම්පත් කළමනාකරණය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්ය මණ්ඩලය අනුමත වී වසර 05 කට ආසන්න වුවත් භාරයේ කළමනාකරු, ගණකාධිකාරි හා අභ්‍යන්තර විගණක යන තනතුරු සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විටත් බඳවා ගැනීම් පරිපාටි අනුමත කරවාගෙන බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. | ධීවර අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතනයක් බැවින් වඩා මූල්‍යමය වාසිදායක ලෙස කළමණාකරන භාරයේ අනුමැතිය මත නිලධාරීන් දෙදෙනා පත් කර ඇති බව දන්වා ඇත. | භාරය විධිමත් ආකාරයෙන් පවත්වා ගෙන යාමට අවශ්‍ය පුරප්පාඩු වූ තනතුරුවලට බඳවා ගැනීම් කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුලත අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ද සමඟ කාර්යසාධන වාර්තාවක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ට ද පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 10 කට පසු 2021 ජනවාරි 18 දින විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි. | කොරෝනා වසංගතය හේතුවෙන් නියමිත දිනට ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව දන්වා ඇත. | ඉකුත් වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන ද නියමිත දිනට ඉදිරිපත් කර නොමැති හෙයින් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ද සමඟ කාර්යසාධන වාර්තාවක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂය සඳහා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්මෙහි අන්තර්ගත නොවූ වාර්ෂික වියදම රු. මිලියන 22.8 ක් වූ පිරිසිදු කිරීමේ සේවාව, වාර්ෂික වියදම රු.මිලියන 8.6 ක් වූ ආරක්ෂක සේවා වියදම හා රු.904,000 ක් වූ ත්‍රීරෝද රථය මිලදීගැනීම වැනි ක්‍රියාකාරකම් ප්‍රසම්පාදන සැලැසුමකින් තොරව ඉටුකර තිබිණි. | 2021 වර්ෂයේ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කිරීමට නිලධාරින්ට උපදෙස් ලබා දී ඇති බව දන්වා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුය. |

### 4.3 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව මුදල් රෙගුලාසි 128 හි සඳහන් පරිදි කළමනාකරණ භාරයේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා පද්ධති හා පාලනය ශක්තිමත් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විට ද අවශ්‍ය පියවරයන් ගෙන නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කළමනාකරණ භාරයේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා පද්ධති හා පාලනය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. |

**4.4** අයවැය ලේඛනය පාලනය

-----------------------------

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1.(අ) ඡේදය ප්‍රකාරව භාර අරමුදලේ අරමුණුවලට අනුකූලව පිළියෙල කරන ලද අයවැය ලේඛනය ඊට පෙර වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඊට පටහැනිව භාර මණ්ඩලය පමණක් අනුමත කරන ලද 2019 වර්ෂයේ අයවැය ලේඛනය 2020 අගෝස්තු 10 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. | පිළිතුරු ලැබී නැත. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කළ යුතුය. |

**4.5** පාරිසරික ගැටලු

-----------------

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරයට අදාලව උද්ගතව ඇති පාරිසරික ගැටලු සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමු කරන ලද පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමේ අයදුම්පත් 2014 මාර්තු 18 දින ඉදිරිපත් කර තිබුණ ද ඒ සඳහා වර්ෂ 6 ක් ඉක්මගොස් ඇතත් එම අධිකාරිය ලබාදී ඇති උපදෙස් ප්‍රකාරව අපිරිසිදු ජලය පිරිසිදු කර(Treatment Plant) මුදාහරින මාර්ග පද්ධතිය හා කාණු පද්ධතිය සඳහා අවශ්‍ය නිවැරදි පියවරයන් නොගැනීම හේතුවෙන් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමට නොහැකි වී තිබුණි. | මධ්‍යම පරිසර අධිකාරිය ලබාදී ඇති උපදෙස් සම්පූණ කිරීමට කටයුතු කර තිබුණද අපජල පවිත්‍රාගාරය පමණක් ඉදිකර නොමැති බවත් ඉදිකර අවසන් කිරීමෙන් පසු බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කළ හැකි බවත් දන්වා ඇත. | ලබාදී ඇති උපදෙස් ඉතා ඉක්මණින් සම්පූණ කර පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගත යුතුය. |